# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2117/7 - 2019 අප්‍රේල් මස 01 වැනි සඳුදා - 2019.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DVIPP/LND/ACQSA/3/10-1.
*ඉඩමේ අමාත්‍යාංශය යොමු අංකය*: 4 -3/2/2016/PT/08.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය :*

වයඹ පළාතේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිවිගන්දහයේ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 372 මාඑළිය දකුණ, මා එළිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ. ග. පි. අංක 1961 අතිරේක අංක 27 පත්‍ර අංක 35 හා 2018.11.15 දිනැති අවසන් ගම් පිඹුරේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0250 ක් පමණ වූ කැබලි අංක 1183 වූ පහත ඉඩම් කොටස් (01).

01. කැබලි අංකය 1183
ඉඩම් නම: බුලුගහමුලකොටුව; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: මෙරගල්පේඩි දූරයලාගේ සුනිල් සිරිසේන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0250.

ඉහත සඳහන් ඉඩම/පරවශ්‍යතාවය හිමිකම, අයිතිවාසිකම හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනා තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.05.27 වැනි දින පූ. භා. 10.00ට ට පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019.04.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩමට/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්. පී. සී. එන්. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

2019 මාර්තු මස 26 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-500

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : ඉ/4/14.
*ඉඩමේ අමාත්‍යාංශය යොමු අංකය* : 4-3/8/2016/pc/430.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුකහ බස්නාහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 1041, දඹදෙණි උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දඹදෙණිය ගමේ පිහිටි, සර්වේ ජෙනරාල් විසින් 2018.12.14 දිනැතිව මැන සකස් කරන ලද අවසාන ගම් පිඹුරු අංක 556 අතිරේක අංක 35 පත්‍ර අංක 33 දරන පිඹුරේ කැබලි අංක 374 වශයෙන් දැක්වෙන "ඔබේසේකර වත්ත *නොහොත් දඹදෙණිවත්ත හෙවත්* ඔබේසේකර වත්ත" නැමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

**කැබලි අංක 374**

ඉඩමේ නම: ඔබේසේකර වත්ත *නොහොත්* දඹදෙණිවත්ත *හෙවත්* ඔබේසේකර වත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1012.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 2019 මැයි මස 08 වැනි දින පෙ. ව. 10.00ට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019 අප්‍රේල් 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියකියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කල යුතුය.

එස්. එම්. පෙත්තාවඩු,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2018 දෙසැම්බර් මස 27 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

04-501

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.